# සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පිළිබඳ ආදි බුදුදහමේ හා මධ්‍යමක සම්ප්‍රදායේ ඉගැන්වීම් අතර සාදෘශ්‍යතා

ඩී. එම්. පියුමි දිසානායක[1]

## හැඳින්වීම

සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් පිළිබඳ තොරතුරු ගවේෂණයේ දී ත්‍රිපිටකාගත මූලාශ්‍රය මෙන්ම පශ්චාත් කාලීනව සිදු කරන ලද අර්ථ විවරණ ද සුවිශේෂ වශයෙන් අගය කරන්නට සිදු වේ. බුද්ධ කාලීන භාරතීය සමාජය තුළ ප්‍රභවස්ථානව පැවති මෙම සත්වයාගේ සම්භවය, පැවැත්ම පිළිබඳ ගැටලුව මුල් බුදුසමයේ සිට මධ්‍යකාලීන බුදු සමය දක්වා ද පශ්චාත් කාලීන බුදුසමය දක්වා ද වර්ධනය වෙමින් විකාශය වූවකි. සත්ත්වයාගේ පැවැත්ම පිළිබඳ දාර්ශනික සංකල්ප ඉදිරිපත් කළ ගුරුකුල අතර අද්විතීය හා සුවිශේෂ ගුරුකුලයක් ලෙස මධ්‍යමක සම්ප්‍රදාය හැඳින්විය හැකිය. සමකාලීන ඇතැම් බෞද්ධ නිකායයන් විසින් බුදුරදුන්ගේ ධර්මය අත්තනෝමතික විවරණයන්ට ලක්කිරීම හේතුවෙන් උද්ගතව තිබූ දාර්ශනික සංදිග්ධතාවන් සහ ව්‍යාකුලත්වයන් යම්තාක් දුරට නිවැරදි කිරීමේ ඓතිහාසික කර්තව්‍යයය මෙම සම්ප්‍රදාය විසින් සිදුකිරීම එසේ සැලකීමට හේතුවයි. මධ්‍යමක දර්ශනයේ එන සිද්ධාන්ත අධ්‍යයනය කිරීමෙන් මධ්‍යමක දර්ශනය හා මුල් බුදුසමය සමග ඇති අත්‍යන්ත සම්බන්ධය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වේ. මධ්‍යමක දර්ශනය පිළිබඳ විමර්ශනශීලීව අධ්‍යයනය කිරීමේ දී, මෙම සම්ප්‍රදාය මහායාන ගුරුකුලයට අයත් වුව ද මහායාන දර්ශනය හෝ වෙනත් දාර්ශනික ස්ථාවරයක් ස්ථාපිත කිරීමට උත්සුක වූ බවක් නොපෙනේ.

මධ්‍යමක සම්ප්‍රදායේ පුරෝගාමියා වූ ආර්ය නාගර්ජුන පාදයන්ගේ මූලික අභිප්‍රාය වී ඇත්තේ සත්ත්වයා හා ලෝකයේ ස්වභාවය පිළිබඳ විවරණයන් කේන්ද්‍ර කර ගනිමින් දේශනා කරන ලද මුල් බුදුසමයාගත බුද්ධ දේශනාව නැවත ස්ථාපිත කිරීමය. සමකාලීන බෞද්ධ අබෞද්ධ චින්තකයන් විසින් සාවද්‍ය ලෙස විග්‍රහ කරන ලදුව දූෂිතව හා ව්‍යාකුලත්වයට පත්ව තිබූ මුල් බුදුදහම නැවත ස්ථාපිත කිරීමට නාගර්ජුන පාදයන් සිය මධ්‍යමක සිද්ධාන්ත උපයුක්ත කර ගත්හ. විවිධ විවේචන අභියෝග එල්ල වුව ද ඒවා මැඩලමින් තම දාර්ශනික සිද්ධාන්තයන් නාගර්ජුන පාදයන් ඉදිරිපත් කළහ.

## පර්යේෂණ ගැටලුව

ආදි බුදුදහමේ සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය පිළිබඳ ඉදිරිපත්කරන විවරණයන් හා මධ්‍යමක ඉගැන්වීම් අතර කෙතරම් සමානත්වයක් පවතීද?

[1] සහකාර කථිකාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය, piumidissanayaka88@gmail.com

**පර්යේෂණ ක්‍රමවේදය**

ආදි බෞද්ධ ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය සහ මහායාන ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය

**සාකච්ඡාව**

ආචාර්ය නාගර්ජුන පාදයන් යනු මධ්‍යමක දර්ශනයේ ආරම්භකයා පමණක් නොව මුල් බුදුසමය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සමාරම්භකයා වශයෙන් ද සැලකිය හැකිය. ඒ බැව් මුල් බුදුදහමේ හා මධ්‍යමක දර්ශනයේ සත්ත්වයාගේ හා ලෝකයේ ස්වභාවය විවරණය කළ දාර්ශනික සිද්ධාන්ත අතර පවත්නා සාදෘශ්‍යතා තුළින් විද්‍යමාන වේ. ඒ බැව් පහත ප්‍රස්තුත ඔස්සේ විශද කෙරේ.ශූන්‍යතාව, නිර්වාණය ප්‍රතීත්‍යසමුත්පාදය,මධ්‍යම ප්‍රතිපදාව, සාපේක්ෂතාවාදය

**නිගමනය**

ආදි බුදුසමය ලෝකය හා සත්ත්වයාගේ ස්වභාවය පිළිබඳ ආත්ම සංකල්පය පදනම් කරගත් අන්තයන් භජනය නොකරයි. මෙම දාර්ශනික විධික්‍රමය මධ්‍යමක දර්ශනයේ පදනම ලෙස සලකා ඇති බව පැහැදිලි වේ. නාගර්ජුන පාදයන් මෙය සිදු කරනුයේ සියලු දර්ශනයන් විචාරයට ලක්කරමිනි. එම විවේචන අබෞද්ධ සම්ප්‍රදායන්ට පමණක් නොව බෞද්ධ සම්ප්‍රදායන්ට ද පොදු ය. මෙම අන්තගාමී, ආදානග්‍රාහී ස්ථාවරයන් බැහැර කරමින් ස්වාධීන දර්ශනයක් ඉදිරිපත් කිරීම නාගර්ජුන පාදයන් උගන්නේ බුදුන් වහන්සේගෙනි. මෙහි සාදෘශ්‍ය වන මූලික ලක්‍ෂණය වන්නේ උභය පක්‍ෂයේ සියලු දාර්ශනික දෘෂ්ටීන් ප්‍රහාණය කර එකී දෘෂ්ටීන් ශූන්‍යතාව මගින් විචාරයට ලක්කොට ආදානග්‍රාහී වීමේ නිරර්ථක බව මෙසේ පෙන්වා දී ඇත.

"අථවා සර්ව භාවානාං - ශූන්‍යත්වාච්ඡාශ්වතාදයඃ
ක්ව කස්‍ය කතමා කස්මාත් - සම්භවිෂ්‍යන්ති දෘෂ්ටයඃ"

මේ ආකාරයට මුල් බුදුදහමේ සත්ත්වයා හා ලෝකය පිළිබඳ ඉගැන්වීම් මධ්‍යමක ඉගැන්වීම් හා සාදෘශ්‍ය වන ආකාරය උක්ත ප්‍රස්තුත ඔස්සේ විවරණය කළ හැකිය.

ප්‍රමුඛ පදඃ සත්ත්වයා හා ලෝකය ,මධ්‍යමක, ශූන්‍යතාව, පටිච්චසමුප්පාදය, නිර්වාණය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*දීඝ නිකාය 02.* (1976). බු.ජ.ත්‍රි.ග්‍ර., දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිම නිකාය 01.* (1964). බු.ජ.ත්‍රි.ග්‍ර, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

සාසනරතන හිමි, මොරටුවේ. (1963). *මූල මධ්‍යමක කාරිකාව*, පී. ජේ. රුද්‍රිගෝ ප්‍රකාශන.

තිලකරත්න, අසංග. (2001). ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.

මේධානන්ද හිමි, දේවාලේගම. (1981). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය.* ආරිය ප්‍රකාශ